# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2031/08 – 2017 අගෝස්තු 08 වැනි අඟහරුවාදා – 2017.08.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහගල්බොඩ මෙගොඩ කෝරළේ සුළු කොට්ඨාසයේ, අංක 725, නාරම්පොළ ග්‍රාමනිලධාරි කොට්ඨාසයේ තෝරයාය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කේයූ/එම්එල්එල්/2013/728 හා 2014.04.23 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0197 ක් පමණ වන කෝන්ගහමුලවත්ත සහ අස්ලියැද්ද නමැති ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – කෝන්ගහමුලවත්ත සහ අස්ලියැද්ද – ප්‍රමාණය: **හෙක්. 0.0197 ක් පමණ**

උතුරට: කුමාරපේලි ආරච්චිගේ ස්ටීවන් හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස සහ දැදුරු ඔය; නැගෙනහිරට: දැදුරු ඔය; දකුණට: දැදුරු ඔය සහ කුමාරපේලි ආරච්චිගේ ස්ටීවන් හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස; බටහිරට: කුමාරපේලි ආරච්චිගේ ස්ටීවන් හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2013/ඩබ්ලිව්එස්/413.
2017 ජූලි මස 05 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 – 753